**ශීර්ෂ 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | බිබිල | (ඉ) | බඩල්කුඹුර | (එ) | තණමල්විල |
| (ආ) | මැදගම | (ඊ) | මොණරාගල | (ඒ) | සෙවනගල |
| (ඇ) | මඩුල්ල | (උ) | බුත්තල | (ඔ) | කතරගම |
| (ඈ) | සියඹලාණ්ඩුව | (ඌ) | වැල්ලවාය | | |

### 1.1 විගණන විෂය පථය

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජුනි 29 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය,මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ

ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 732 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් මිලියන 727 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 5 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.68 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 340.9 | 340.5 | 0.4 | 0.12 |
| මූලධන | 390.7 | 386.2 | 4.5 | 1.15 |
| **එකතුව** | **731.6** | **726.7** | **4.9** | **0.67** |

#### (ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 19 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 1,992 ක් හා රු.මිලියන 645 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,637 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.මිලියන 1,771 ක් හා රු.මිලියන 615 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,386 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 221 ක් හා රු.මිලියන 30 ක් වශයෙන් එකතුව රු.මිලියන 251 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 27701 | 33 | 29 | 24 | 31 | 165 | 99 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 582 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6003/0000/00/0053/0000/000 | 282 |
| 6000/0000/00/0011/0602/000 | 300 |
| **එකතුව** | **582** |

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 277 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල

---

### 3.1 විගණන සාක්ෂි නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නියඟයෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය රැස් කිරීම සඳහා 2014 ඔක්තෝබර් මාසයේදී රු.985,100 ක් එක්තරා පුද්ගලික ආයතනයක් වෙත ගෙවා මිලදී ගෙන තිබූ ජල ටැංකි හා කෑන් බෙදාහැරීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 වන දින රු.479,450 ක් වැය කර මිලදී ගත් භාණ්ඩ බෙදා හැරීමේ විස්තරද, ඉන් රු.449,450 කට අදාල බිල්පතද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් ජල බවුසරය සඳහා 2014 අගෝස්තු මාසයේ අවස්ථා 4 ක දී නිකුත් කර තිබූ එකතුව රු.19,424 ක් වටිනා ඉන්ධන ලීටර් 160 ක් ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2014 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ බෙදාදීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින එක්තරා පුද්ගලික ආයතනයකින් රු.1,000,000 ක් වැය කර ක්‍රීඩා උපකරණ මිල දී ගෙන තිබුණි. අදාල භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තර සහ නොබෙදා ඉතිරි වූ ක්‍රීඩා භාණ්ඩ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

---

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාලව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.5,466,980 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ කාන්තා සමිති 02 ක් සඳහා බුෆේ සෙට්, මාතෘ සායන උපකරණ, මහන මැෂින් හා ෆේස්ප්‍රේ දියර ඉසින යන්ත්‍ර ලබාදීමට 2014 දෙසැම්බර් 01 දින රු.1,450,000 ක ප්‍රතිපාදන මොණරාගල දිස්ත්‍රික් ලේකම් වෙත එවා තිබුණි. එම වැඩ සටහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු නොකර ඉන් රු.1,447,800 ක් 2014 දෙසැම්බර් 31 දින ඌව පළාත් සභාවේ සෞඛ්‍ය,දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත ගෙවා තිබුණි.

(ii) අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් විවිධ වැඩසටහන් යටතේ බෙදාහැරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් 2012, 2013 හා 2014 වර්ෂවලදී එකතුව රු.37,712,454 ක් වැය කර ද්‍රව්‍ය හා උපකරණ ඒකක 113,278 ක් මිලදී ගෙන තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම ද්‍රව්‍ය හා උපකරණ ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගබඩා කර තිබුණි.

(iii) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුඹුක්කන දෙගල් අරඹ සිට මාගල් ආර දක්වා විදුලි වැට ඉදිකිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දින රු.5,411,832 ක් ගෙවා වැට කණු හා උපාංග මිලදී ගෙන තිබුණි. 2015 මාර්තු 25 දින වන විටත් අදාල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. විදුලි වැට ඉදිකිරීමට පෙර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ සඳහා 2015 මාර්තු 13 දින ඉල්ලීමක් කර තිබුණි. ඒ අනුව ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමටත් පෙර මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(iv) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 ගම නැගුම විශේෂ වැඩසටහන හා එක් ගමකට එක් වැඩක් වැඩසටහනක් යටතේ රත්තනපිටිය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 සැප්තැම්බර් 09 දින

එක්තරා ගොවි සංවිධානයකට රු.1,485,990 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. 2015 මාර්තු 26 දින වනවිට ඒ සඳහා රු.1,267,567 ක් ගෙවා තිබුණු අතර ඉන් රු.1,220,000 ක් ජලනල උපාංග හා වතුර මෝටරයක් මිලදී ගැනිම සඳහා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමිතිය වෙත ගොවි සංවිධානය විසින් ගෙවා තිබුණි. මෙම ජලනල උපාංග හා මෝටරය මිලදී ගැනීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතු වුවත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමිතිය විසින් ඒවා මිලදී ගෙන තිබුණ අතර විගණන දිනය වන විටත් ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(v) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ හුලංදාව දකුණ පානීය ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2014 අගෝස්තු 01 දින රු.980,465 කට එක්තරා ගොවි සංවිධානයකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. විගණන දිනය වූ 2015 මාර්තු 25 දින වන විට ඒ සඳහා රු.799,919 ක් වැය කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජල මනුවක් මිලදී ගෙන සවිකිරීම සඳහා රු.2,850 ක් බැගින් ජල මනු 90 ක් සඳහා රු.256,500 ක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් එක් ජල මනුවක් රු.2,450 බැගින් මිලදී ගෙන තිබුණු අතර 2015 මාර්තු 25 දින වන විට ජල මනු 56 ක් සවිකර නොතිබුණි.

(vi) මොනරාගල ප්‍රාද්ශීය ලේකම් කාර්යාලය විසින් වැඩසටහන් 03 ක් යටතේ වූ කර්මාන්ත 03 ක ඉටු නොකළ වැඩ සඳහා එකතුව රු.89,163 ක් 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි.

(vii) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වල්ලිමාතාගම ගම්මානය සඳහා ජල නල දීර්ඝ කිරීම වෙනුවෙන් 2014 වර්ෂයේ පළාත් නැගුම වැඩ සටහන යටතේ 2014 දෙසැම්බර් 31 දින වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.3,790,162 ක් ගෙවා තිබුණි. විගණන දිනය වූ 2015 මාර්තු 23 දින වන විටත් අදාල කර්මාන්තය ඉටු කර නොතිබුණි.

(viii) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කර්මාන්ත දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 දෙසැම්බර් මාසයේදී රු.2,334,090 ක් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණි. විගණන දිනය වූ 2015 මාර්තු 23 දින වන විටත් අදාල කර්මාන්ත ආරම්භ නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

(ix) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 අප්‍රේල් 04 හා 2013 ඔක්තෝබර් 04 යන දිනවල බුද්ධ ශාසන

හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් රු.80,000 ක් එවා තිබුණි. 2015 මාර්තු 26 දින වන විටත් අදාල කාර්ය ඉටු නොකර එම මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(x) විහාර ආධාර වැඩසටහන යටතේ 2011 දෙසැම්බර් 13 දින මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් විහාරස්ථාන දෙකකට ලබා දිය යුතු රු.20,000 ක මුදල අදාල විහාරස්ථ දායක සභාවන් වෙත නොගෙවා 2015 ජනවාරි 28 වන දින අමාත්‍යාංශය වෙත හරවා යවා තිබුණි.

(xi) තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී රාජ්‍ය භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය ලබා දුන් ප්‍රතිපාදනවලින් මිලදී ගෙන තිබූ රු.16,550 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ ඒකක 02 ක් අදාල ප්‍රතිලාභීන්ට බෙදා නොතිබුණු අතර ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා ගෙන තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ දෙකක් ඉක්ම වූ රු.27,569,509 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් 31 දිනැති අංක PF/FD/04/148 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ධාන්‍ය නිෂ්පාදනය සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරිම සඳහා රු. මිලියන 300 ක් ලැබී තිබුණු අතර එය තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර විගණන දිනය වූ 2015 අප්‍රේල් 20 දින වන විටත් අක්‍රීය තැන්පතුවක් වශයෙන් පැවතුණි.

(ඇ) මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය විවෘත කිරීමේ උත්සවයේ විදුලි වියදම් වෙනුවෙන් 2014 දෙසැම්බර් 04 දින ලංකා විදුලිබල මණ්ඩලය වෙත නිකුත් කළ රු.204,780 ක් වටිනා චෙක්පත අවලංගු කර 2014 දෙසැම්බර් 27 දින පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. විගණන දිනය වූ 2015 අප්‍රේල් 20 දින වන විටත් එම තැන්පතුව නිරවුල් කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,244,107 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ගකර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **වත්කම් වර්ගය** | | **ඒකක ගණන** | **නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය** |
|---|---|---|---|
| | | | **වර්ෂ** |
| (i) | ඉඩම් (හෙක්ටර්යාර) | 0.34 | 05 |
| (ii) | ගොඩනැගිලි | 04 | 02 සිට 09 දක්වා |
| (iii) | මෝටර් වාහන | 07 | 10 සිට 20 දක්වා |
| (iv) | යන්ත්‍ර සූත්‍ර | 01 | 02 |

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු.355,177 ක් විය.

**3.7 අනුකූල නොවීම්**

---------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| | XIX පරිච්ඡේදයේ 5:4:1 වගන්තිය. | 117,634 | බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 වසරේ සිට 2014 ජනවාරි මාසය දක්වා ගණකාධිකාරී නිල නිවාසයේ පදිංචිය වෙනුවෙන් නිවාස කුලී අඩුවෙන් අයකරගෙන තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 138 (8) | 116,375 | 2014 වර්ෂයේ දී බිල්පත් ඉදිරිපත් කර නොතිබූ අසම්පූර්ණ වවුචර් 03 ක් වෙනුවෙන් කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 237 | 1,034,933 | මොණරාගල හා කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තොග සහතික නොමැතිව මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 137,138,139 හා 237 | 9,706,800 | මොණරාගල, කතරගම, තණමල්විල, බුත්තල හා මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට අසම්පූර්ණ ගනුදෙනු සඳහා චෙක්පත් 91 ක් නිකුත් කර විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් ආදායකයින්ට භාර නොදී අත රඳවාගෙන තිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2011 ජුනි 29 දිනැති අංක EST/07/TRAVEL/06/3030 දරන ආයතන අධ්‍යක්ෂගේ ලිපියේ 2 ඡේදය. | 23,000 | කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයාට සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |

**(ඈ) ජනාධිපති ලේකම් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2013 ජුලි 05 දිනැති PC/MD/PR/2013 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය | - | ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ මාස 03 ක් ඇතුළත අපහරණය කිරීමට පියවර ගතයුතු නමුත් මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යේ වාහන 03 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

## 3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් එකතුව රු. 274,046,001 කට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 37 ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර ඒ සඳහා එකතුව රු.10,765,959 ක් වැය කළ පසු අතහැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු වටිනාකම | 2014 දෙසැම්බර් 31 දිනට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | රු. | |
| මඩුල්ල | 25 | 266,079,847 | 10,128,575 | සඳහන් කර නොමැත. |
| තණමල්විල | 01 | 240,760 | 72,000 | අධික වර්ෂාව |
| වැල්ලවාය | 02 | 548,391 | - | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, අධික වර්ෂාව |
| සියඹලාණ්ඩුව | 09 | 7,177,003 | 565,384 | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති අතහැර දැමීම, ව්‍යාපෘති 04 ක තොරතුරු සඳහන් කර නැත. |
| **එකතුව** | **37** | **274,046,001** | **10,765,959** | |

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොවුල් ආර උතුර ජල ව්‍යාපෘතිය වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවලදී එකතුව රු.781,131 ක් වැයකර තිබුණද විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් අදාල ව්‍යාපෘතියට විදුලිය ලබා ගත නොහැකි වීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොවුල් ආර දකුණ පෙර පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2014 වර්ෂයේ මහජන නියෝජිතයින්ගේ විශේෂ ව්‍යාපෘති යටතේ 2014 දෙසැම්බර් 25 දින රු.199,168 ක් ගෙවා සිමෙන්ති, රූම්කෝ ෂීට් සහ දහර කම්බි ලබා දී තිබුණද, 2015 මාර්තු 30 දින වන විටත් දැව ලබා ගැනීමේ අපහසුතාවය නිසා වහල සෙවිලි කිරිමට නොහැකි වී තිබුණි.

(iii) සෙවනගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ මහජන නියෝජිතයින්ගේ විශේෂ ව්‍යාපෘති යටතේ කටුපිලගම අරුණ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ඇස්බැස්ටෝස් ෂීට් 55 ක් ලබා දීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින රු.69,925 ක් ගෙවා තිබුණ ද, 2015 මාර්තු 30 දින වන විට ගොඩනැගිල්ල සඳහා අත්තිවාරම පමණක් ඉදිකර තිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණ සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කතරගම ඇසළ උත්සවය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අතිරේක විදුලිය වෙනුවෙන් විදුලි ජනක යන්ත්‍ර සැපයීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් නොමිලේ සිදු කර තිබුණද, 2013 හා 2014 වර්ෂවල විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් විදුලි බල මණ්ඩලය වෙත රු.4,143,354 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි.

(ආ) එකම වර්ගයේ විදුලි ජනක යන්ත්‍ර 4 ක් සැපයීම වෙනුවෙන් 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේ දී රු.294,180 ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ විදුලි ජනක යන්ත්‍ර 4 ක් සඳහා කම්කරු කුලී වශයෙන් රු.1,406,511 ක් ගෙවා තිබුණද යෙදවූ කම්කරුවන් ප්‍රමාණය හා මිල ගණන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේ දී විදුලි ජනක යන්ත්‍ර 4 ක් සඳහා ඉන්ධන ලීටර් 530 ක් යෙදවීම වෙනුවෙන් රු.62,342 ක් වැඩිපුර ගෙවා තිබූ අතර එම මුදල අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසය අමාත්‍යාංශ ලේකම්වරයාගේ හෝ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියකින් හෝ කුලී ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව පාවහන් නිෂ්පාදන කාර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි. මෙම නිල නිවස සඳහා 2010 මාර්තු 08 දින රු.1,200 ක මාසික ආර්ථික කුලියක් තක්සේරු කර තිබුණු අතර ඒ අනුව 2013 සැප්තැම්බර් මාසයේ සිට 2015 මාර්තු මාසය දක්වා එකතුව රු.22,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශීර්ෂයෙන් රු.272,471 ක් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂයෙන් රු. 3,697,734 ක් වශයෙන් එකතුව රු.3,970,205 ක් වැය කර තිබුණි. උත්සවය වෙනුවෙන් උත්සව භාණ්ඩ කුලියට ගෙන ඒ සඳහා රු. 3,190,600 ක් වැය කර තිබුණත්, ඒ සඳහා විධිමත් පරිදි ලංසු කැඳවීමක් කර නොතිබුණි.

## 3.10 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

-----------------------------------------

2007 වර්ෂයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලේ ප්‍රතිලාභ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය මගින් ගෙවීම සඳහා රු.14,497,572 ක් මුදාහැර තිබුණි. එම මුදලින් විවිධ ප්‍රතිලාභීන්ගේ නම් සඳහන් කර රු.4,659,980 ක් ගෙවූ බව ව්‍යාජව සඳහන් කර මූල්‍යමය වංචාවක් සිදුකර තිබුණි.

## 3.11 පාඩු හා හානි

----------------

මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු කැබ් රථයක වැසිය පිපිරීම සම්බන්ධයෙන් දිසා යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු කර වාර්තාවක් ලබා ගෙන අදාළ පරීක්ෂණ කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 04 ක් වෙත බෙදා හැරීම සඳහා 2014 මාර්තු හා අප්‍රේල් මාසවල පොල් සංවර්ධන මණ්ඩලයෙන් පොල් පැළ 4,728 ක් මිලදී ගෙන තිබුණි. එම පොල් පැළ බෙදාදීම පිළිබඳ පසුවිපරම් කටයුතු 2014 අගෝස්තු 12 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ආ) මඩුල්ල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන්ට සියයට 60 ක සහනාධාර මත බඩ ඉරිඟු බීජ ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ කිලෝ ග්‍රෑම් 5 ක බඩ ඉරිඟු බීජ පැකට් 5700 ක් වෙනුවෙන් රු.26,790,000 ක් එක්තරා වෙළඳ ආයතනයක් වෙත ගෙවා තිබුණි. කිලෝ ග්‍රෑම් 5 ක බඩ ඉරිඟු බීජ පැකට් 2641 ක් බෙදා හැර නොතිබූ හෙයින් ඒ සඳහා ප්‍රතිලාභී දායකත්වය වන රු.4,965,080 ක මුදල 2015 අප්‍රේල් 29 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. එම බීජ පැකට් 2015 ජුනි මාසයේදී කල් ඉකුත් වීමට නියමිතව තිබුණි. ඒ අනුව බීජ පැකට් 2641 වෙනුවෙන් රජය විසින් ගෙවන ලද රු.12,412,700 ක් වූ මුළු වියදම අනාර්ථික වියදමකි.

**3.13 විසඳා නොතිබුණු විගණන ඡේද**

**-----------------------------------**

2013 අප්‍රේල් 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විගණකාධිපති වාර්තා සාකච්ඡාවට භාජනය විය. එහිදී ගන්නා ලද කමිටු තීරණයන් හා නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.14 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව මොනරාගල ආහාර ගබඩාවේ සේවය කරන ආදේශක මුරකරුවන් දෙදෙනෙකුගේ 2014 වර්ෂයේ වැටුප් ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබිය යුතු මුදල රු.586,044 ක් වුවද අදාල දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ මුදල රු.398,432 ක් විය. ඒ අනුව ආහාර දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 187,612 ක මුදල 2015 ජනවාරි වන විටත් ලබා දී නොතිබුණි.

(ආ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුතුකණ්ඩිය ව්‍යාපාරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේදී ඉඩම් කැබලි 24 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු. 6,686,850 ක වන්දි මුදල විගණිත දිනය වූ 2014 නොවැම්බර් 19 දින වන විටත් ගෙවා නොතිබුණි.

(ඇ) සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් ලබා දී තිබූ බදු කරුවන් 15 දෙනෙකු විය. 1995 ජුනි 15 දින සිට 2015 නොවැම්බර් 20 දින දක්වා එකතුව රු.7,875,397 ක බදු මුදලක් ද, එක් බදු කරුවෙකුගෙන් 2005 මාර්තු 31 දින සිට 2014 නොවැම්බර් 01 දින දක්වා රු.31,000 ක බදු මුදලක්ද වශයෙන් එකතුව රු. 7,906,397 ක බදු මුදලක් අය කර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් සමෘද්ධි ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන යටතේ 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ ණය මුදලින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු. 6,232,493 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.15 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 28 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 28 | 02 | 26 |
| (iii) | ද්විතියික මට්ටම | 744 | 633 | 111 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 110 | 105 | 05 |
| | එකතුව | 923 | 768 | 155 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 155 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්කයේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පංතියේ නිලධාරීන් රාජකාරී ඉටුකරන පදනමින් ප්‍රාදේශීය ලේකම්වරු ලෙස පත් කර තිබුණි.

(ඇ) සහකාර සමෘද්ධි කොමසාරිස් තනතුර 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර, වර්තමානයේ දිවිනැගුම අධ්‍යක්ෂක තනතුර නමින් හඳුන්වන මෙම තනතුරද විගණන දිනය වූ 2015 අප්‍රේල් 10 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඈ) මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර ඉඩම් කොමසාරිස් තනතුර අවුරුදු 03ක පමණ සිට පුරප්පාඩුව පැවැතුණි.

(ඉ) කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු 4 ම පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා වැඩ බැලීමේ පදනම මත හා රාජකාරි ඉටු කිරීමේ පදනම මත නිලධාරීන් යොදවා තිබුණි.

(ඊ) වෙනත් අමාත්‍යාංශ යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2014 දෙසැම්බර් 31 දින වන විට අනුමත සේවක සංඛ්‍යාවට අමතරව ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් එක් අයෙක්ද, තෘතියික මට්ටමේ නිලධාරීන් 06 ක්ද, ද්වීතියික මට්ටමේ නිලධාරීන් 443 ක්ද යොදවාගෙන තිබුණි.